ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**මහ කොමසාරිස්තුමා පාස්කු දින ත්‍රස්ත ප්‍රහාරයේ දෙවන සංවත්සරය නිමිත්තෙන් පැවති වැඩසටහනට සහභාගී වේ**

මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා කුරිරු පාස්කු දින ත්‍රස්ත ප්‍රහාරයේ දෙවන සංවත්සරය නිමිත්තෙන් 2021 අප්‍රේල් 21 වන දින ශාන්ත අන්තෝනි දේවස්ථානයේ පැවති වැඩසටහනට සහභාගී විය. එතුමා ප්‍රහාරයෙන් මිය ගිය අය සිහි කරමින් ඉටිපන්දම් දැල්වූ අතර ප්‍රහාරයෙන් තුවාල ලබා තවමත් ප්‍රතිකාර ලබන අයට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළේය.

2. 2020 මැයි 8 වන දින ඉන්දියාවෙන් අත්‍යවශ්‍ය ඖෂධ පරිත්‍යාගයක් රැගත් විශේෂ ගුවන් යානයකින් ශ්‍රී ලංකාවට පැමිණි මහ කොමසාරිස්තුමා දින 14ක අනිවාර්ය නිරෝධායන කාල සීමාවෙන් පසු 2020 මැයි 23 වන දින ද මෙම දේවස්ථානයේදී ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ට උපහාර දැක්වීය. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ද 2019 ජූනි මාසයේදී සිදු කළ සුහද සංචාරයේදී මෙම දේවස්ථානයට පැමිණ ප්‍රහාරයෙන් මිය ගිය අයට උපහාර පුද කළේය.

3. ශාන්ත අන්තෝනි දේවස්ථානය පාස්කු දින ප්‍රහාර මාලාවේ එක් ඉලක්කයක් වූ අතර එම ප්‍රහාරයන්ගෙන් ඉන්දියානුවන් 10 දෙනෙකු ද ජීවිතක්ෂයට පත් විය. එම ඉන්දියානු ජාතිකයන් ෂැංග්‍රි-ලා, කිංස්බරි සහ සිනමන් ග්‍රෑන්ඩ් හෝටල්වල සිදු වූ ප්‍රහාරයන්ට ගොදුරු විය.

4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ආරක්ෂක ක්ෂේත්‍රයේ සියලු අංශයන්හි සමීප සහයෝගිතාවයකින් කටයුතු කරයි. ත්‍රස්තවාදයට එරෙහි සටනේදී ඉන්දියාව ශ්‍රී ලාංකීය ජනතාව සහ රජය සමඟ සිටින අතර මත්ද්‍රව්‍ය ජාවාරම ඇතුළු අනෙකුත් නීතිවිරෝධී කටයුතු මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් ද සහයෝගයෙන් කටයුතු කරයි.

***

***කොළඹ***

***2021 අප්‍රේල් 21***